**සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගමය - 2021**
---------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරිමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යායුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳාපවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 76,087,305 ක ලාභයක් වූ අතර, ඉකුත් වර්ෂයේ එයට අනුරූප ලාභය රු. 29,395,843 ක් වූ බැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. 46,691,462 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන හේතු වන්නේ අලෙවි කරන ලද ඒකක සංඛ්‍යාව වැඩිවීම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්වල වැඩිවීමයි.

### 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම සියයට 49 කින් වැඩි වී ඇති අතර විකුණුම් පිරිවැය සියයට 48 කින් වැඩි වී ඇත.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා අනෙකුත් මෙහෙයුම් ආදායම් සියයට 146 කින් වැඩි වී ඇත. මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වන්නේ අබලි ද්‍රව්‍ය අලෙවිය ඉහළ යාමයි.

(ඇ) සමාගමේ මූල්‍ය ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 93 කින් සහ සමාගමේ මූල්‍ය පිරිවැය සියයට 42 කින් අඩු වී ඇත.

### 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) සමාගමේ දළ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 6 සිට සියයට 7 දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව, ශුද්ධ ලාභ ආන්තිකය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 2 සිට සියයට 4 දක්වා වැඩි වී ඇත.

(ආ) ස්කන්ධ මත ප්‍රතිලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 5 සිට සියයට 12 දක්වා වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්කම්වල ශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පූර්ව ඇස්තමේන්තුවලට සාපේක්ෂව වෙනස් වන්නේ නම්, එම වෙනස්කම් ගිණුම්ගත කළ යුතුය. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු.85,414,488 ක් වූ වත්කම් ශේෂ පත්‍රයේ සඳහන් වත්කම් වටිනාකම්වලට ඇතුළත් වන අතර ඒවා සඳහා ලියා හළ වටිනාකම් නොමැත. ඉකුත් වර්ෂය තුළ පරීක්ෂණ බංකු වැනි ඇතැම් වත්කම් ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වුවද, විදේශ විනිමය සීමා කිරීම් හේතුවෙන් නව යන්ත්‍රෝපකරණ ආනයනය | LKAS 16 ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| සමාගම විසින් උපයෝජනය කරනු ලබන, සම්පූර්ණයෙන් ක්ෂය කළ රු.85,414,488 ක් වන වත්කම් ඒ අනුව සමාලෝචනය කර නොතිබුණි. | කිරීමට නොහැකි විය. එබැවින් 2022 වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත්, තවමත් උපයෝජනය කරනු ලබන පිරියත ප්‍රත්‍යාගණනය කිරීමට අපි තීරණය කළෙමු. |

**3.2** **ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශයට අනුව, සමාගම විසින් වසර 03ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2021 වර්ෂයේ සමාසික දෙක සඳහා අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර ඇති අතර, 2021 අගෝස්තු 18 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒ පිළිබඳව සාකච්ඡා කරන ලදී. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 7.2 ඡේදයට අනුව, සමාගම විසින් විස්තීර්ණ පාලන සහ පරිපාලන ක්‍රියාපටිපාටි අත්පොතක් පිළියෙළ කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ගිණුම් ඉදිරිපත් කළ යුතු වුවද, සමාගමට එම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 7.4.1 ඡේදයට අනුව, සමාගම මගින් විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු (SDG) පිළිබඳ එක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රයට” අනුකූලව සියළුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට දායක විය යුතුය. කෙසේ වුවද, සමාගම විසින් තිරසාර සංවර්ධන අරමුණු සහ සාක්ෂාත් කරගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීමේ දී ඇති විය හැකි පරතර සහ ප්‍රගතිය මැනීමට සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි. | සමාගම විසින් දැනට කුඩා පරිමාණයෙන් ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි. සාමාන්‍යයෙන් නිෂ්පාදන සමාගමට බලපාන තත්ත්වය පිළිබඳව සැලකිල්ලට ගනිමින් තිරසාර සංවර්ධන අරමුණු (SDG) සඳහා කිසිදු ඉලක්කයක් නියම කර නැත. | සමාගම තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයට" අනුකූලව කටයුතු කළ යුතුය. |